# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/1/9/9/1(I) | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.02.09 |

ලේකම්,
(ප්‍රධාන/කෘෂිකර්ම/ධීවර/අධ්‍යාපන/ක්‍රීඩා) අමාත්‍යාංශය,
දකුණු පළාත.

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා ගැනීම.</u>

ඔබ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පවතින ආයතනයන්හි දෙපාර්තමේන්තුගත තනතුරු වල සේවය කරන නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා මා වෙත ඉදිරිපත් කිරීමේ දී පහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

I. අදාළ තනතුරේ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පරිපාටිය අනුව වසරකට කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන වාර ගණන

II. සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පරිපාටිය අනුව වසරකට එක් වරක් පමණක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන්නේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2015 අනුව අයදුම්පත් හා ඔබගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

III. සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පරිපාටිය අනුව වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන්නේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2018 අනුව අයදුම්පත් හා ඔබගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

02. තවද, අදාල චක්‍රලේඛ ප්‍රකාර ව නිර්දේශ නොකරන අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිනොගන්නා බවත්, නැවත හරවා එවීමට කටයුතු කරන බවත් දන්වා ඇති බැවින් නිවැරදිව සම්පූර්ණ කරනු ලබන කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා ගැනීමේ අයදුම්පත් නිසි නිල මඟින් නිර්දේශ කර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

**දීපිකා කේ. ගුණරත්න,**
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 4944002 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 4119011<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.